# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2365/28 – 2024 ජනවාරි මස 03 වැනි බදාදා – 2024.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2022/120.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ඩබ්. ඩබ්. එම්. බී. එම්. ජී. කේ. බී. වැකඩපොල මහතා, අංක 129/20/T, කලල්ගොඩ, පන්නිපිටිය.

සහ

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කොළඹ 04, බම්බලපිටිය,


1A – G 41152 – 09 (2023/12)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ගාලුපාර, අංක 411/16, නීතිඥ ආර්. නවෝදයම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2023 දෙසැම්බර් මස 15 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2022/120.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ඩබ්. ඩබ්. එම්. බී. එම්. ජී. කේ. බී. වැකඩපොල මහතා, අංක 129/20/T, කලල්ගොඩ, පන්නිපිටිය.

සහ

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය, වික්‍රමසිංහ, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

" 1997.08.15 දින සිට සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ සේවා නියුතුව, 2011.08.15 දින සිට එම ආයතනයේ ජ්‍යෙෂ්ඨ කැමරා ශිල්පියෙකු ලෙස සේවය කරන කේ. ඩබ්. ඩබ්. එම්. බී. එම්. ජී. කේ. බී. වැකඩපොල මහතාට සහකාර කළමනාකාර (වැඩසටහන්) හෝ සහකාර කළමනාකරු ප්‍රවෘත්ති සහ කාලීන සිදුවීම් ( ප්‍රසම්පාදන) තනතුර හිමි ද? හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද කවරදා සිට ද යන්න පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 - 0414

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.